# COVID 19 සති පාසල - 01
# 10 ශ්‍රේණිය - ව්‍යවසායකත්ව අධ්‍යයනය

ව්‍යාපාරවල ප්‍රමාණය මත ව්‍යාපාර ප්‍රධාන වර්ග තුනකට බෙදිය හැකිය.

- කුඩා පරිමාණ ව්‍යාපාර
- මධ්‍ය පරිමාණ ව්‍යාපාර
- මහා පරිමාණ ව්‍යාපාර

කුඩා පරිමාණ ව්‍යාපාරයක් යනු පෞද්ගලික හිමිකාරත්වය යටතේ ස්වාධීනව මෙහෙයවනු ලබන සාපේක්ෂව **කුඩා සේවක සංඛ්‍යාවක්** සහ **අඩු ආයෝජනයක්** සහිත ව්‍යාපාර නම් වේ.

❖ **කුඩා පරිමාණ ව්‍යාපාරයක ගතිලක්ෂණ වන්නේ,**
කුඩා ප්‍රාග්ධනයක් යොදා තිබීම
සේවක සංඛ්‍යාව අඩුවීම
ව්‍යාපාරය තනි අයිතිකරුවකු සතු වීම
ව්‍යාපාරය පවත්වාගෙන යාමේ දී තීරණ ගැනීමට ඇති පහසුව
ව්‍යාපාර කටයුතු කුඩා ප්‍රදේශයකට සීමා වීම

❖ **කුඩා පරිමාණ ව්‍යාපාර සහ ව්‍යවසායකත්වය අතර ඇති සම්බන්ධතාවය වන්නේ ,**
බොහෝ සාර්ථක මහා පරිමාණ ව්‍යාපාරවල ආරම්භක අවස්ථාව කුඩා පරිමාණ ව්‍යාපාරයක් වීම.
ව්‍යවසායකයන්ට නිර්මාණශීලී කුසලතා ප්‍රායෝගික භාවිතය පහසු වීම තුළින් නවෝත්පාදන බිහි වීම.
වෙළඳපල හිදැස හඳුනාගෙන ව්‍යාපාර අවස්ථා සඳහා පිවිසිය හැකි වීම.

**අභ්‍යාස -:** පෙළපොත පිටු අංක 46, ක්‍රියාකාරකම් 01 සහ පිටු අංක 48, ක්‍රියාකාරකම් 02 සම්පූර්ණ කිරීම.